# බුත්තල ප්‍රාදේශීය සභාවේ ජල යෝජනාක්‍රමවල ජලනල සේවාසම්බන්ධ ගිවිසුම් පත්‍රය

බුත්තල ප්‍රාදේශය සභාබල ප්‍රදේශය තුළ පිහිටි මළිගාවිල හාජනාවාස 9/11 රහතන්ගම ජල යෝජනාක්‍රමයෙන් ජල මනුවක් මගින් ගෘහ/වාණිජ කාර්යයන් සඳහාජලය ලබාගැනීම සම්බන්ධ වූ ගිවිසුම් පත්‍රයයි.

එක් පාර්ශවයකට මෙහි මින්මතු බුත්තල ප්‍රාදේශීය සභාව වෙනුවෙන් බුත්තල ප්‍රාදේශීය සභාවේ සභාපති/ ලේකම් නම් වූ............................................................................................................................................ නමැති අයද ඔහුගේ අනුප්‍රාප්තිකයන්ද (පළමු පාර්ශවය) අනෙක් පාර්ශවය බදුකරු වශයෙන් සදහන් වන්නාවූ ........................................................................................................................................ පටුමගේ පිහිටි අංක ..................................................... දරණ ස්ථානයේ පදිංචි (මෙහි මින් පසුව අයිතිකරු හෝපදිංචිකරු හෝ) යනුවෙන් පහත සදහන් කරනු ලබන ........................................................................................................................................... නමැති අයද ඔහුගේ/ ඇයගේ උරුමක්කාර/ පෙල්මකාර/ අද්මිනිස්ත්‍රාසිකාර/ බලකාරයින් ඇතුළුව (දෙවන පාර්ශවය) දෙපාර්ශවය විසින් මෙහි පහත දක්වෙන කොන්දේසි වලට හානියමයන්ට යටත්ව පළමු පාර්ශවය විසින් දෙවන පාර්ශවය වෙත ජල සේවාව සැපයීම සම්බන්ධයෙන් එකී දෙපාර්ශවය පහත සදහන් ප්‍රකාරව ගිවිසුම් ඇති කරගන්නා ලදී.

- **කොන්දේසි හානියමයන්:-**

01.අඟල් ½ ක ජල මෙනුවක් මගීන් ජලය සැපයිය යුතුය.
02.ජල මනුවක් මාර්ගයෙන් ජලය සපයනු ලබන අවස්ථාවේ රු:............ ක ගාස්තුවක් ගෙවිය යුතුය.
03.ජල ඒකක සඳහාඅයකරන මුදල් පහත පරිදි වේ.

**<u>ගෘහස්ථ කාර්යයන් සඳහා-</u>**

ඒකක 1-10 දක්වාඒකකයකට රු.25 බැගින්
ඒකක 11-25 දක්වාඒකකයකට රු.35 බැගින්
ඒකක 21-25 දක්වාඒකකයකට රු.50 බැගින්
ඒකක 26-30 දක්වාඒකකයකට රු.60 බැගින්
ඒකක 30ට වඩාවැඩි ඒකක සඳහාරු.65 බැගින් අය කරනු ලැබේ.

**<u>වාණිජ කාර්යයන් සඳහා-</u>**

ඒකකයකට රු. 75 බැගින් අය කරනු ලැබේ.
(ඒකක සඳහාඅයකරන මුදල කලින් කල සභාතීරණ මත වෙනස් විය හැකිය.)

04. මනුද ඇතුලත් සියළුම උපකරණ ජල සම්බන්ධතාවය ලබාගත් පසු බුත්තල ප්‍රාදේශීය සභාවට අයත් දේපල වේ. ඒවාට අත පෙවීමට තාත් කිරීම හෝඅලාභහානි සිදුකිරීම වරදකි.

05.බුත්තල ප්‍රාදේශීය සභාවේ බලයලත් නිලධාරීන්ට අදාල ගෙවස්ථානයට ඇතුල්වීමට බලය ඇත.

06.බිල්පත් සඳහාමුදල් නොගෙවීම, අයථාපරිදි ජලය ලබාගැනීම, සපයන ජලය අපතේ යැවීම ආදී හේතූන් මත ජල සැපයුම් විසන්ධි කරනු ලැබේ.

07. මළිගාවිල ජල ව්‍යාපෘතිය සහ ජනාවාස 9/11 ජල ව්‍යාපෘතිය සඳහාරු.25000.00 ක් සේවාගාස්තු වශයෙන් ද ලිපි ද්‍රව්‍ය ගාස්තු ලෙස රු.100.00 ක් ද අය කෙරේ. එමෙන්ම ගෘහස්ථ තාන්පතු ගාස්තු ලෙස රු. 7500.00 ක්ද වාණිජ කටයුතු සඳහා තාන්පතු ගාස්තු ලෙස රු.15000.00 ක් ද අය කරන අතර නිවැරදිව හිඟයකින් තොරව ජල මනුව නැවත සභාවට භාර දීමෙන් පසු එම තාන්පතු ගාස්තු අදාළ පාරිභෝගිකයාවෙත ගෙවනු ලැබේ. (මෙම මුදලද සභාතීරණය මත වෙනස් විය හැකිය.)

08. මනුවලට අනිසි ලෙස අත ගැසීම මනු වල මුද්‍රාකැඩීම හාඅයතාපරිදි ජලය ලබාගැනීම සඳහාදඩය ගෘහ අය කිරීම සහ වෙළද හා කාර්යාල අයකිරීම රු. 15000.00 කි. බිල්පත් මාසිකව නොගෙවීම හේතුවෙන් විසන්ධි කිරීමෙන් අනතුරුව මසක් ඇතුලත ජල සම්බන්ධතාවය ලබාගන්නේ නම් රු.2500.00 ක් ද මසකට පසුව ජල සම්බන්ධතාවය ලබාගන්නේ නම් රු. 5000.00 ක් ද යලි ඇමුණුම් ගාස්තු වශයෙන් ගෙවිය යුතුය. (මෙම මුදලද සභාතීරණය මත වෙනස් විය හැකිය.)

09.ජල මනුව හානිවස අතර ජලනල මාර්ගය අළුත් වැඩියාකිරීමට සිදු වුවහොත් ඒ සඳහාඅවශ්‍ය ද්‍රව්‍ය සපයියි යුතු අතර, ශ්‍රම කුලිය ගෙවිය යුතුය.

10. නියමිත මාසයේ ජල ගාස්තුව ජල බිල්පත නිකුත් කිරීමේ දිනයේ සිට දින 15 ( පහළොවක්) ඇතුළතදී බුත්තල ප්‍රාදේශීය සභාකාර්යාලයට හෝබලයලත් නිළධාරියාට නොගෙවුවහොත් එම ජල සම්බන්ධතාව බුත්තල ප්‍රාදේශීය සභාව සතු කරගතයුතුවන් මෙන්ම බුත්තල ප්‍රාදේශීය සභාව විසින් ඔබගේ ජල සැපයුම විසන්ධි කරනු ලැබේ.

11.1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන ( සම්මත අතුරු ව්‍යවස්ථාපනත) 34 අතුරු ව්‍යවස්ථාව යටතේ හිඟ ජල ගාස්තු අයකර ගැනීම සඳහානීතිමය පියවර ගනු ලැබේ.

12.ගිවිසුම් අවලංගු කිරීම පූර්වෝක්ත දෙපාර්ශවයෙන් එක් පාර්ශවයක අභිප්‍රාය වුවහොත් එසේ තීරණය කළ පාර්ශවය තමන්ගේ එකී අභිප්‍රාය අනෙක් පාර්ශවය වෙත දින 30 ට ප්‍රථමයෙන් දැනුම් දී එසේ කළ යුතුය. එසේ ගිවිසුම් අවලංගු කිරීමෙන් පසුව නැවතත් අලුත් ගිවිසුමකට ඇතුලත් නොවී අයිතිකරුට හෝපදිංචිකරුට හෝනැවත ජල සේවාව පාවිච්චි කිරීමට කිසිදු අයිතිවාසිකමක් හෝබලයක් නොමැත.

13. කලින් කලට වෙනස්වන ජල ගාස්තු හා අංක 7,8 හි සඳහන් ගාස්තු ගෙවිය යුතුය.

14. පදිංචිය වෙනස් වීමට හේතු වුවහොත් කවර හෝඅවස්ථාවකදී ඒ බව අයිතිකරු හෝපදිංචිකරු විසින් යථාපරිදි බුත්තල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝබලයලත් නිළධාරියාට දැනුම් දීම කළ යුතුය.

මෙම ගිවිසුමේ සඳහන් සියලු කොන්දේසි විමසා බලා තේරුම්ගෙන දෙපාර්ශවයම විසින් අත්සන් කලේ වර්ෂ.................ක් වූ................. මස.................... දින බුත්තල ප්‍රාදේශීය සභාකාර්යාලයේදී ය.

දෙවන දෙපාර්ශවය (බදුකරු) ගේ අත්සන:-...........................................................................

**මුද්දරය**

නම:-.........................................................................................................

ලිපිනය:-.....................................................................................................

ජාහැ අ.:-...................................................................................................

දිනය-.................................

සක්ෂි

| නම | ලිපිනය | ජාහැඅ. | අත්සන |
|---|---|---|---|
| 01......................................... ......................................... | ............................. ............................. | ............................. ............................. | ............................. ............................. |
| 02......................................... ......................................... | ............................... ............................... | ............................... ............................... | ............................. ............................. |

.........................................

සභාපති
බුත්තල ප්‍රාදේශීය සභාව

..................................

සභාලේකම්
බුත්තල ප්‍රාදේශීය සභාව

සක්ෂි

01. ...............................
02. .................................

20......../............. මස ................. දින බුත්තල ප්‍රාදේශීය සභාවේදී අප දෙදෙනාඉදිරිපිටදී ඉහත මුද්‍රාව තබා අත්සන් කරන ලදී.